## **11** වැනි පරිශිෂ්ටය
(XII – 16:5)

## පිටරට අධ්‍යාපනය හා රැකියාව යන ද්විත්ව අරමුණු සඳහා වැටුප් රහිත නිවාඩු දෙනු ලබන නිලධරයන් අත්සන් කළ යුතු ගිවිසුමේ ආකෘතිය

(ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමතිය නොමැතිව මෙම ආකෘතිය සංශෝධනය නොකළ යුතු ය)

(මෙහි මින්මතු නිලධරයා යනුවෙන් සඳහන් කෙරෙන) (1) ------------------- නමැත්තා එක් පක්ෂයකට ද, (මෙහි මින්මතු ජනරජය යනුවෙන් සඳහන් කෙරෙන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් හා වෙනුවට ක්‍රියා කරන (මෙහි මින්මතු (2)----------------------- යනුවෙන් සඳහන් කෙරෙන) ශ්‍රී ලංකාවේ (2)------------------------------ තනතුර දරන (3) ----------------------- අනෙක් පක්ෂයකට ද බැඳී ( (2)---------------------- තනතුර දරන එකී (3)--------------- ගෙන් පසු එම තනතුරට තත්කාලීනව පත්වන ඔහුගේ අනුප්‍රාප්තිකයෝ ද (2)--------------- යන පාඨයට ඇතුළත් වන්නාහ.) එම දෙපක්ෂය විසින් වර්ෂ දෙදහස් --------------------- ක් වූ ---------------- මස ----------------- වැනිදා වන මෙදින ලියා අත්සන් කරනු ලබන ගිවිසුම් පත්‍රයයි.

(1) නිලධරයාගේ සම්පූර්ණ නම සහ තනතුර

(2) දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ පදවි නාමය

(3) දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සම්පූර්ණ නම

(4) වැටුප් රහිත නිවාඩුපිට සිටින කාලය

(5) ----------------------- ට ගොස් (6) ------------------ පිළිබඳ අධ්‍යයන/අභ්‍යාස පාඨමාලාවක් හදාරා ----------------------- තනතුරක සේවය කිරීමට හැකිවනු පිණිස එම නිලධරයා මුල් වතාවට මාස (4)------------- ක කාලයක් සඳහා වැටුප් රහිත නිවාඩු ඉල්ලා ඇති හෙයින් ද,

(5) කාර්ය පැවරුම බාර ගැනීමට යන රට

එසේ ම එකී කාර්යය සඳහා එකී නිලධරයාට 20--------------------- වැනිදා පටන් මාස -------------- ක කාලයක් සඳහා වැටුප් රහිත නිවාඩු දීමට ජනරජය එකඟ වී ඇති බැවින් ද ,

(6) කාර්ය පැවරුමේ ස්වභාවය

දැන් මේ ලියා අත්සන් කරන ගිවිසුමේ වග හැටි මෙසේ ය -

(1) (5) ----------------------- ගොස් (6) --------------------- පිළිබඳ අධ්‍යයන/අභ්‍යාස පාඨමාලාවක් හැදෑරීම හා ------------- තනතුරක නියුක්ත වීමට හැකිවනු වස් යථෝක්ත නිලධරයාට 20 ------- වැනිදා පටන් මාස -------------- ක වැටුප් රහිත නිවාඩු අනුමත කිරීමට ජනරජය එකඟ වෙයි.

(2) එකී නිලධරයා-

i. ඉහත කී වැටුප් රහිත නිවාඩුව අනුමත කිරීමට හේතු වූ අධ්‍යයන/අභ්‍යාස පාඨමාලාව නොපිරිහෙලා අනලස්ව හදාරා ස්වකීය තනතුරට අයත් රාජකාරි හරිහැටි ඉටු කරන බවට ද,

ii. එකී (2)-------------------- ගේ පූර්වානුමතිය නොලබා ස්වකීය අධ්‍යයන/අභ්‍යාස පාඨමාලාව නොහොත් ස්වකීය තනතුර වෙනස් කිරීම හෝ එම අධ්‍යයන/අභ්‍යාස පාඨමාලාව කෙටි කිරීම හෝ එකී වැටුප් රහිත නිවාඩුවෙන් ඉතිරිව ඇති කිසිම කාල පරිච්ඡේදයක් වෙනත් කිසිම කාර්යයක් සඳහා යොදා ගැනීම හෝ නොකරන බවට ද,

(iii) ඉහත කී වැටුප් රහිත නිවාඩු කාලය අවසන් වීම නොහොත් ඉහත සඳහන් අධ්‍යයන/අභ්‍යාස පාඨමාලාව හෝ තනතුර අවසන්වීම යන දෙකින් කුමක් හෝ පළමුවෙන් සිදු වූ වහාම ශ්‍රී ලංකාවට ආපසු පැමිණ ජනරජය කරන තීරණය අවසාන තීරණය හැටියට පිළිගැනීමට බැඳෙමින් ජනරජය නියම කරන පරිදි කිසියම් පදවියක වැඩ බාරගෙන එසේ වැඩ භාරගත් දින සිට මාස (7)------- කට නොඅඩු කාලයක් ජනරජය යටතේ සේවය කිරීම සඳහා බැඳෙන බවට ද,

**(7)** අනිවාර්ය සේවා කාලය

එතෙකුදු වුවත්, සේවය කිරීමට බැඳී සිටින සේවා කාලය, වෛකල්පික විශ්‍රාම යාමේ වයස (අවුරුදු 55) ඉක්මවා යන අවස්ථාවක දී සේවය කිරීමට බැඳී සිටින කාලයෙන් ඉතිරි කාල සීමාව වෙනුවෙන් ජනරජය විසින් තීරණය කරනු ලැබිය හැකි එවැනි යම් මුදලක් එකී නිලධරයා ජනරජයට ගෙවීමට යටත්ව එකී නිලධරයාට විශ්‍රාම යාමට අවසර දීමට ජනරජයට පුළුවන.

(iv) තමාට අනුමත කරන ලද වැටුප් රහිත නිවාඩුව අවසන් වූ විට ශ්‍රී ලංකාවට පැමිණීම පැහැර හැරියහොත් හෝ ශ්‍රී ලංකාවට ආපසු පැමිණීමෙන් පසු ඉහත සඳහන් පරිදි ජනරජය යටතේ වැඩ බාර ගැනීමට අපොහොසත් වුවහොත් හෝ ඉහත සඳහන් පරිදි ජනරජය යටතේ වැඩ බාර ගැනීමෙන් පසු වැඩ බාරගත් දින සිට යටත් පිරිසෙයින් මාස (7) ----------------------- ක් වත් සේවය කිරීමට අපොහොසත් වුවහොත් හෝ ඉහත සඳහන් පරිදි වැඩ බාරගත් පසු එකී මාස (7) ----------------------- ක කාලය අවසන් වීමට පෙර අකාර්යක්ෂමතාව නිසා හෝ වියදම් අඩු කිරීමේ හේතුව හැරුණු විට වෙනත් කිසියම් හේතුවක් නිසා හෝ සේවයෙන් පහකරනු නොහොත් ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ එසේ නැතහොත් මෙම ගිවිසුමේ කොන්දේසි අතුරෙන් කිසිවක් සපුරාලීමට අසමත් වුවහොත් හෝ එවිට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් (8)---------------------- ජනරජයට ගෙවීමට ද මෙයින් එකඟ වෙයි.

**(8)** දණ්ඩන මුදල

(3) තමාට දෙන ලද වැටුප් රහිත නිවාඩු කාලය දීර්ඝ කරන ලෙස එකී නිලධරයා ඉල්ලා සිටිය විටෙක දී ජනරජයේ හුදු අභිමතය අනුව එම වැටුප් රහිත නිවාඩු කාලය වරින් වර දීර්ඝ කිරීමට ජනරජයට පුළුවන් බවට ද, පාර්ශ්වකරුවන් අතරේ මෙයින් තවදුරටත් ගිවිස ගනු ලැබේ. එතෙකුදු වුවත්, වැටුප් රහිත නිවාඩු කාලය එසේ දීර්ඝ කරනු ලබන කල්හි නැවත වැඩ බාර ගැනීමෙන් පසු සේවය කළ යුතු අවම අනිවාර්ය සේවා කාලය ජනරජය විසින් තීරණය කෙරෙන තවත් අමතර කාලයකින් ද, එසේම මෙම ගිවිසුමේ කොන්දේසි කඩ කළහොත් යථෝක්ත නිලධරයා ගෙවිය යුතු මුදල ජනරජය විසින් තීරණය කෙරෙන තවත් අමතර මුදලකින් ද ඒ අනුව වැඩි කළ යුතු වන්නේ ය.

(4) වැටුප් රහිත නිවාඩු කාලය ඒ ආකාරයෙන් දීර්ඝ කිරීමෙන් ඉක්බිතිව නිලධරයා සේවය කිරීමට බැඳී සිටිය යුතු අවම අනිවාර්ය සේවා කාලයත්, මේ ගිවිසුමේ කොන්දේසි කඩ කළහොත් නිලධරයා ගෙවිය යුතු මුදලත් සමානුපාතිකව වැඩි කරනු ලබන අවස්ථාවකදී මෙම ගිවිසුමේ දැනට සඳහන්ව ඇති වැටුප් රහිත නිවාඩු කාල සීමාව, අනිවාර්ය සේවා කාලය හා නිලධරයා ගෙවිය යුතු වන මුදල යන මේවා වෙනුවට එකී වැටුප් රහිත කාල සීමාවන්හි මුළු එකතුව ද, අනිවාර්යය

සේවා කාල පරිච්ජේදයන්හි මුළු එකතුව හා නිලධරයා ගෙවිය යුතු මුදල් ප්‍රමාණයන්හි මුළු එකතුව ද මේ ගිවිසුමේ ඒ ඒ අදාළ වගන්තිවල පිළිවෙළින් ඇතුළත් කොට ඇත්තා සේ කියවිය යුතු බවට ද එසේම තේරුම් ගත යුතු බවට ද මෙයින් ගිවිස ගනු ලැබේ.

(5) වැටුප් රහිත නිවාඩුව සම්පූර්ණ කළ පසුව හෝ ඒ පිළිබඳව තීරණයක් ගත් වහාම නිලධරයා ශ්‍රී ලංකාවට පැමිණි විට ඔහු ඉහත සඳහන් වන පරිදි මාස (7) --------------------- ක් සේවයෙහි නියුක්ත කරවා ගැනීමට ජනරජය බැඳී සිටින බවක් මෙහි සඳහන් වන කිසිවකිනුත් අදහස් කෙරෙතැයි නොසැලකිය යුතු ය.

(6) ඉහත කී 2, 3 හා 4 වගන්තිවල සඳහන් කවර කරුණක් පිළිබඳව වුවද, (2)--------------------------- විසින් හෝ ඔහු වෙනුවට හෝ අත්සන් කරන ලද සහතිකයක්, එහි අඩංගු කරුණු නොහොත් එහි තබා ඇති අත්සන ඔප්පු කිරීම සඳහා අතිරේක හෝ වෙනත් සාධක නොමැතිව මුල් බැල්මට පිළිගැනෙන සාක්ෂියක් වන බවට මෙයින් ගිවිස ගනු ලැබේ.

(7) ------------------------------- (2) යන පාඨයෙන් අදහස් කරන්නේ ------------------------------- (2) තනතුර දරන්නා වූ හෝ එම තනතුරේ වැඩ බලන්නා වූ හෝ ------------------------ විසින් දැනට කරනු ලබන කාර්යයන් එවකට ඉටු කරන්නා වූ හෝ නිලධරයායි.

මීට සාක්ෂි වශයෙන් මේ ලියවිල්ලට සම්බන්ධ වන දෙපක්ෂය විසින් වර්ෂ දෙදහස් ---------------ක් වූ ---------- මස ------------- වැනි දා වන මෙදින -----------------------දී මෙසේ අත්සන් තබන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් එකී ------------------(2) විසින් පහත සඳහන් අය ඉදිරිපිට දී අත්සන් කළ බවට-

අත්සන:--------------------

පදවි නාමය:---------------

**සාක්ෂිකරුවෝ :-**

1. අත්සන : --------------------
   නම : --------------------
   ලිපිනය : --------------------

2. අත්සන : --------------------
   නම : --------------------
   ලිපිනය : --------------------

එකී ------------------------------ විසින් පහත සඳහන් අය ඉදිරිපිට දී අත්සන් තබන ලද බවට -

අත්සන : ------------------

**සාක්ෂිකරුවෝ :-**

1. අත්සන : --------------------
   නම : --------------------
   ලිපිනය : --------------------

2. අත්සන : --------------------
   නම : --------------------
   ලිපිනය : --------------------